සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 6 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය

**නම/විභාග අංකය :- ........................................................** **කාලය: පැය 02 යි.**

- සියලුම ප්‍රශ්නයන්හට පිළිතුරු සපයන්න.
- ඉතා සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) ඊමාන් කළ යුතු කරුණු අතරින් පස්වැනි කරුණ,
(1) ආගම් (2) මලාඉකවරුන් (3) මිනිසුන් (4) රසුල්වරු

(02) ගින්නෙන් මවනු ලැබූ මැවීම් කෙනෙකි,
(1) මලාඉකවරු (2) ජින්වරු (3) මිනිසුන් (4) රසුල්වරු

(03) සුළඟ,ජලය,ගින්න සඳහා බාරව සිටින මලක්වරයා,
(1) මිකාඊල් (අලෛ) (2) ඉස්රාෆිල් (අලෛ) (3) ජිබ්රීල් (අලෛ) (4) ඉස්රාඊල් (අලෛ)

(04) ස්වර්ගයේ යතුර,
(1) සලාතය (2) උපවාසය (3) සකාත් (4) හජ්

(05) නබිවරයකුගේ වරාසත් වූ දෙයකි,
(1) රණ් (2) විශ්වාසය (3) රිදී (4) අධ්‍යාපනය

(06) අල්කුර්ආන්හි තිබෙන සූරාවන් ගණන,
(1) 114 (2) 7 (3) 6666 (4) 30

(07) මාස දාහකට වඩා උතුම් වූ රාත්‍රියක්,
(1) සිකුරාදා (2) ලෛලතුල්කද්ර් (3) ආෂුරා (4) අවුරුදු දින

(08) කදීජා (රලි) තුමියගේ සුවිශේෂී නම,
(1) ඉමාරා (2) හුමෛරා (3) අස්සිද්දීකා (4) තාහිරා

(09) ඊමාන්හි පහළම තත්වය,
(1) දෙමාපියන්ට උපකාර කිරීම (2) ජීවීන් සඳහා ආදරය දැක්වීම
(3) පාරෙහි මිනිසුන් හට හානි කරන දෙයක් ඉවත් කිරීම (4) ආගන්තුක සත්කාර

(10) අප අතරින් ගැටුම් ඇතිවීමට ප්‍රධාන කරුණු වලින් එකකි,
(1)ආත්මාර්ථකාමීත්වය (2)පරාර්ථකාමීත්වය (3) කායිකශක්ති (4) උත්සාහය

(11) ඇත් වර්ෂය හැඳින්වන අරාබි පදය,

(1) අබාබිල් (2) ආමුල්ෆීල් (3) ආමුල් හුස්න් (4) යව්මුල් ෆීල්

(12) අල්කුර්ආනය ග්‍රන්ථාරූඩ කිරීමේ කටයුතු වල නිරතවූ සහාබිවරයා,

(1) සෛද්බින් සාබිත් (රලි) (2) සල්මාන් ෆාරිස් (රලි) (3) ෆාතිමා (රලි) (4) අබ්බාස් (රලි)

(13) නබි (සල්) තුමාට කිරි පෙවූ මව,

(1) මෛමුනා (රලි) (2) හලීමා (රලි) (3) ආමිනාතුමිය (4)උම්මුල්ෆල්ල්තුමිය

(14) අස්සිහාහුස්සිත්තා යනු,

(1) අවසන්දිනය (2) හදීස් ග්‍රන්ථ (3) කුර්ආන්විවරණ (4)ඉතිහාස පොත්

(15) නබි (සල්) තුමා පළමුවෙන්ම ප්‍රසිද්ධව ඉස්ලාම් ආගම දේශනා කළ ස්ථානය,

(1) අරෆා (2) සීරා (3) සෆා (4)මර්වා

(16) අල්කුර්ආන්හි තුනෙන් එක් කොටසට සමාන සූරාව,

(1) සූරාෆාතිහා (2) සූරා ඉඛ්ලාස් (3) සූරාෆලක් 4)සූරානාස්

(17) සලාතයෙහි ෂර්තයන් එකකි,

(1) අත්තහියියාත් (2) සුජූද් (3) සලාතය ඉටු කරන ක්‍රමය දැන ගැනීම

(4) සූරා ෆාතිහා පාරායනය කිරීම

(18) ඉස්ලාම්හි දෙවැනි නීති මූලාශ්‍රය,

(1) අල්කුර්ආන් (2) හදීස් (3) ඉජ්මා (4) කියාස්

(19) අන්නාමූසුල් අ:ලම් නම් සුවිශේෂී නමින් හැඳින් වූ මලක්වරයා,

(1) නූහ් (අලෛ) (2) ජිබ්රීල් (අලෛ) (3) මාලික් (අලෛ) (4) රිල්වාන් (අලෛ)

(20) මක්කාවේ සිට මදීනාවට පැමිණි අය,

(1) මුහාජිර්වරුන් (2) අන්සාරිවරුන් (3) සහාබාවරුන් (4) හනීෆ්වරුන්

(ලකුණු 2×20 = 40)

## II කොටස

**සැලකිය යුතුයි.**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (1) නබි (සල්) තුමාගේ මව සහ පියාගේ නම් සඳහන් කරන්න.

(2) නබි (සල්)තුමා උපත ලැබූ ක්‍රි.වර්ෂය කුමක් ද? උපත ලැබූ වර්ෂය හැඳින්වෙන්නේ කෙසේ ද?

(3) නබි (සල්)තුමාගේ සුවිශේෂී නම් දෙකක් ලියන්න.

(4) නබි (සල්)තුමාට ප්‍රථමයෙන් වහී පහළවූ ස්ථානය කුමක් ද? එවිට එතුමාට වයස කීයද?

(5) නබි (සල්)තුමා ක:බාව නිර්මානය කරන විට වයස අවුරුදු කීය ද?

(6) නබි (සල්)තුමාගේ තරුණ කාලයේ සිදුවූ ප්‍රධාන සිද්ධීන් දෙකක් සඳහන් කරන්න.

(7) නබි (සල්)තුමාගේ බිරින්දෑවරු දෙදෙනෙකු නම් කරන්න.

(8) හදීස් යනු කුමක් ද?

(9) හදීස් කලාවේ ප්‍රසිද්ධ වූ සහාබාවරු දෙදෙනෙකු නම් කරන්න.

(10) සූරා ඉඛ්ලාස් සඳහා වෙනත් නම් දෙකක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) (1) ආමන්තුබිල්ලාහ් යනු තේරුම කුමක් ද?

(2) ඉස්ලාමීය වගකීම් වලින් දෙකක් ලියන්න.

(3) නජීස්හි කොටස් කුමක් ද?

(4) ජලයෙහි කොටස් දෙක කුමක් ද?

(ලකුණු 2 +2+3+3 =10)

(03) (1) පිරිසිදු කම සම්බන්ද හදීසයක් සඳහන් කරන්න.

(2) උපවාසයෙහි ෆර්ලයන් කුමක් ද?

(3) ප්‍රධාන මලාඉකාවරු තිදෙනෙකු හා ඔවුන්ගේ කාර්යභාර්ය ද සඳහන් කරන්න.

(4) සලාතයේ ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(ලකුණු 2 +2+3+3 =10)

(04) (1) මක්කාවේ පහළවූ සූරාවන් හැඳින්වෙන්නේ කෙසේ ද?

(2) ඇත් සේනාව විනාශ කළ පක්ෂීන් කණ්ඩායම කුමක් ද? මෙම සිද්ධිය සඳහන් වන සූරාව කුමක් ද?

(3) අනුමැතිය ලැබීමට තිබෙන ක්‍රමවේද තුන කුමක් ද?

(4) අල්කුර්ආනය පාරායනය කිරීමට පෙර කළ යුතු ක්‍රියාවන් තුනක් සඳහන් කරන්න.

(ලකුණු 2 +2+3+3 =10)

(05) (1) සව්මයෙහි ප්‍රධාන අරමුණ කුමක් ද?

(2) දෙමාපියන් සඳහා දරුවන් ප්‍රාර්ථනා කළ යුතු දුආව කුමක් ද?

(3) දෙමාපියන්ට කළ යුතු උපකාරයන් තුනක් සඳහන් කරන්න.

(4) අල්කුර්ආන්හි අවසන් සූරා තුනම කුමක් ද?

(ලකුණු 2 +2+3+3 =10)

(06) (1) නබි (සල්)තුමාගේ ගැහැණු දරුවන් දෙදෙනෙකු නම් කරන්න.

(2) නබි (සල්)තුමාගේ පිරිමි දරුවන් දෙදෙනෙකු නම් කරන්න.

(3) ආයිෂා (රලි)තුමියගේ සුවිශේෂී නම් දෙක හා එතුමියගේ මවගේ නම ද සඳහන් කරන්න.

(4) අභ්‍යන්තර පිරිසිදු කම ඇති කිරීමට අවශ්‍ය යහ ක්‍රියාවන් තුනක් සඳහන් කරන්න.

(ලකුණු 2 +2+3+3 =10)

(07) තේරුම ලියන්න.

(1) ෆලක් -

(2) ඉඃලාස් -

(3) මලික් -

(4) ෆීල් -

(5) කිරාඅතුල් කුර්ආන් -

(6) සජදා -

(7) කලාමුල්ලාහ් -

(8) කුත්තාබුල්වහී -

(9) අල්ලාහුහාලිකුනා -

(10) අල්ලාහු රාසිකුනා -

(ලකුණු 1×10 =10)